සවියෙන් පෙරට අපි එකට

e- ඉගෙනුම් පාසල

හොරණ අධ්‍යාපන කලාපය

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 7 | ඉතිහාසය | 2 | 4.1 කොටස<br>පසුකාලීන පාලන මධ්‍යස්ථානය |

සැකසුම: පතිරගේ මේනක සුරංග

පාතකඩ ක.වි

# පසුකාලීන පාලන මධ්‍යස්ථානය

- අනුරාධපුර රාජධානිය වසර 1500ක් පැවතුණි.
- පොළොන්නරුව රාජධානිය වසර 150ක් පැවතුණි.
- අනුරාධපුර පොළොන්නරුව රාජධානි පැවති අවධි රජරට ශිෂ්ටාචාරය ලෙස හඳුන්වයි

- ක්‍රි.ව 1215 පොළොන්නරුව බිඳ වැටීමේ සිට ක්‍රි.ව 1415 කෝට්ටේ රාජ්‍ය ආරම්භ තෙක් වසර 200 ක් තුළ රාජධානි 05 පැවත ඇත.
- ක්‍රි.ව 1215 පොළොන්නරුව බිඳ වැටීම සිදු වේ.
- ඊට ආසන්නතම හේතුව කාලිංග මාඝගේ ආක්‍රමණයයි

# රාජධානි නිරිත දිගට සංක්‍රමණය වූ ආකාරය

අනුරාධපුරය

↓

පොළොන්නරුව

↓

දඹදෙණිය

↓

යාපහුව

↓

කුරුණෑගල

↓

ගම්පොල

↓

කෝට්ටේ

# රජරට පැරණි නගර පරිහානියට පත් වීමෙන් පසු ඇති කරගත් පාලන මධ්‍යස්ථාන

මහා වංශයට අනුව, මාඝගේ හමුදාව පොළොන්නරුව අල්ලාගෙන සිටියදී ආක්‍රමණිකයන්ට දකුණට ඒමට ඉඩනොදී රටත්, ජනතාවත් ආරක්ෂා කළ නායකයන්:

- මිණිපේ ගංදෙණිය පර්වතයේ බලකොටුවක් පිහිටුවාගත් සංඛ සෙනෙවි
- යාපහුව කඳු මුදුනේ බලකොටුවක් පිහිටුවාගෙන සිටි සුභ සෙනෙවි
- රුහුණේ ගොවින්දමලය කඳු මුදුනේ බලකොටුවක් තනාගෙන සිටි බුවනෙකබාහු ආදිපාදතුමා

# වරින් වර රාජධානි බිහිවීමට හේතු

1. ආරක්ෂක හේතු
2. ආර්ථික හේතු

**<u>1. ආරක්ෂක හේතු</u>**

(1) අභ්‍යන්තර හේතු - උදා - රාජ්‍ය උරුමකරුවන් අතර පැවති ගැටුම්

(2) බාහිර හේතු - උදා විදේශ රටවලින් එල්ල වූ ආක්‍රමණ තර්ජන

# වරින් වර රාජධානි බිහිවීමට හේතු

## 2. ආර්ථික හේතු


- ලෝකයේ සිදු වූ නව වෙළඳ ප්‍රවණතා අනුව ලංකාවේ විදේශ වෙළඳ කටයුතු වලත් නවතාවයක් ඇති වීම

  උදා - අලි ඇතුන්,මුතු මැණික් ආදියට මෙන්ම තෙත් කලාපය තුළ පැවති කුළුබඩු වලටත් ඉල්ලුමක් ඇති වීම


- රජරට වාරි පද්ධතිය විනාශ වීමත් සමඟ තෙත් කලාපය තුළ නව වගා ක්‍රමවලට ජනතාව හුරුවීම

  උදා - හෙල්මළු වගාව, කුඩා කුඹුරු වගාව

# ශ්‍රී ලංකාවේ පැරණි ප්‍රදේශ බෙදීම



# පොළොන්නරුව රාජධානියෙන් පසුව පැවති රාජධානි කිහිපයක්



**සවියෙන් පෙරට අපි එකට**
**e- ඉගෙනුම් පාසල**
**හොරණ අධ්‍යාපන කලාපය**

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 7 | ඉතිහාසය | 2 | 4. I කොටස<br>පසුකාලීන පාලන මධ්‍යස්ථානය - ඇගයීම |

**සැකසුම: පතිරගේ මේනක සුරංග**
**පාතකඩ ක.වි**

1. 1215 වර්ෂයේ පොළොන්නරුව අල්ලාගත් කාලිංග දේශයේ සිට පැමිණි ආක්‍රමණිකයා කවුද?
2. කාලිංග මාඝගේ එම සේනාව රටේ දකුණට ඒම වැළැක් වු නායකයන් තිදෙනෙකු හා ඔවුන් පිහිට වු බලකොටු නම් කරන්න
3. වරින් වර රාජධානි බිහිවීමට බලපෑ හේතු මොනවාද ?
4. රාජධානි කේන්ද්‍ර කරගත් පරිපාලන බෙදීම් මොනවාදැයි නම් කරන්න.
5. මායාරටෙහි පිහිටි රාජධානි කේන්ද්‍ර කරගත් ප්‍රධාන නගර මොනවාද?

**සවියෙන් පෙරට අපි එකට**
***e*- ඉගෙනුම් පාසල**
**හොරණ අධ්‍යාපන කලාපය**

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 7 | ඉතිහාසය | 2 | 4.1 කොටස<br>පසුකාලීන පාලන මධ්‍යස්ථානය - පිළිතුරු |

**සැකසුම: පතිරගේ මේනක සුරංග**
**පාතකඩ ක.වි**

1. කාලිංග මාඝ

2. I මිනිපේ - සංඛ සෙනෙවි

   ii යාපහුව සුභ සෙනෙවි

   Iii ගෝවින්දමලය - බුවනෙකබාහු ආදිපාද

3. ආරක්ෂක හේතු

   ආර්ථික හේතු

4. රජරට, මායාරට, මලයරට, රුහුණුරට

5. යාපහුව, කුරුණෑගල, දඹදෙණිය, කෝට්ටේ

සවියෙන් පෙරට අපි එකට

e- ඉගෙනුම් පාසල

හොරණ අධ්‍යාපන කලාපය

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 7 | ඉතිහාසය | 3 | 4. II කොටස<br>පසුකාලීන පාලන මධ්‍යස්ථානය |

සැකසුම: පතිරගේ මේනක සුරංග

පාතකඩ ක.වි

# දඹදෙණි රාජධානි සමය (ක්‍රි.ව 1232-1272)

- තුන්වන විජයබාහු රජතුමා (ක්‍රි.ව 1232-1236)
- ප්‍රාදේශීය නායකයකු ලෙස නැගී සිටීම
- මායා රට එක්සේසත් කිරීම
- දඹදෙණි අගනුවර කරගත් ප්‍රථම පාලකයා වීම
- කොත්මලේ සඟවා තිබූ දන්ත ධාතුව දඹදෙණියට වැඩමවා බෙලිගල කඳු මුදුනේ දළඳා මැදුරක් ඉදිකර තැන්පත් කිරීම

# දෙවන පරාක්‍රම බාහු රජු මුහුණ දුන් අභියෝග

1. කාලිංග මාඝ පලවා හැරීම

2. චන්ද්‍රභානුගේ ප්‍රථම ආක්‍රමණය

2. චන්ද්‍රභානුගේ දෙවන ආක්‍රමණය

# දෙවන පරාක්‍රම බාහු රජු මුහුණ දුන් අභියෝග ජයගත් අයුරු

- ක්‍රි.ව 1215 කාලිංග මාඝ පරාජය කිරීම
- චන්ද්‍රභානුගේ පළමු හා දෙවන ආක්‍රමණ පරාජය කිරීම

# දෙවන පරාක්‍රමබාහුගේ සේවාවන්

1 බෙලිගල තැන්පත් කර තිබු දළදාව දඹදෙණියට වැඩම කිරිම

2 දේව ප්‍රතිරාජ ඇමතිවරයා ලවා රටේ සංවර්ධන වැඩ කටයුතු සිදු කරවීම

3. ශ්‍රී පාදස්ථානයට යන මාර්ගය වැඩි දියුණු කරවීම

4. උයන් තැනවීම , පාලම් සෑදවීම , පොල් වැනි භෝග වගා කරවීම

5. ''කව්සිළුමිණ '' නම් මහා කාව්‍ය රචනා කිරීම

6. ''කලිකාල'' සාහිත්‍ය සර්වඥ පණ්ඩිත'' යන උපාධි නාමයෙන් පිදුම් ලැබීම

# යාපහුව රාජධානිය

- පළවන බුවනෙකබාහු රජු ප්‍රථමවරට පාලන මධ්‍යස්ථානය ලෙස තෝරා ගැනිම

<u>පළවන බුවනෙකබාහු රජුගේ සේවාවන්</u>

1 යාපහුවේ දළදා මැදුරක් ඉදි කිරිම

2 බෞද්ධ පොත්පත් රචනා කරවීම

3 මිසරය (ඊජිප්තුව) සමඟ වෙළඳ සම්බන්ධතා පැවැත්වීම

# කුරුණෑගල රාජධානිය

- දෙවන බුවනෙකබාහු රජු කුරුණෑගල රාජධානියේ ආරම්භ පාලකයායි
- දෙවන බුවනෙකබාහු රජුගෙන් පසු IV වන පරාක්‍රමබාහු රජු බවට පත්වේ. ඔහු මෙම යුගයේ ශ්‍රේෂ්ඨතමයා ය

# IV වන පරාක්‍රමබාහුගේ සේවාවන්

1 කුරුණෑගල දළදා මැදුරක් තැනීම

2 පාලියෙන් ලියා තිබූ පන්සිය පනස් ජාතක පොත සිංහලයට පරිවර්තනය කිරිම

3 දළදා සිරිත , සිංහල බෝධිවංශය ඇතැම් පොත්පත් කරවීම

4 මහනුවර අස්ගිරි විහාරය හා වීදාගම ශ්‍රී ඝනානන්ද පිරිවෙන කරවීම

# ගම්පොළ රාජධානිය

- හතරවන බුවනෙකබාහු රජු යටතේ ආරම්භ වේ
- මෙකල ආර්ය චක්‍රවර්ති රජ පරපුර යාපනය පාලනය කලේය
- අලකේශ්වර පරපුර යටතේ රයිගම රාජ්‍ය පැවතුනි

# ගම්පොල යුගයේ වැදගත් සිදුවීම්

1 රජුට අමතරව නිශ්ශංක අලකේශ්වර හා සේනාධිලංකාර යනුවෙන් බලවත් ප්‍රභූ පවුල් දෙකක් විය

2 නිශ්ශංක අලකේශ්වර ඇමතිවරයා කොට්ටේ බලකොටුවක් තනවා ආර්ය චක්‍රවර්ති හමුදා පරාජය කිරිම

3 ඉබන් බතූතා නම් අරාබි ජාතික සංචරකයා ලංකාවට පැමිණීම

4 ගම්පොළ යුගය අවසාන සමයේ චීනයේ චොංගෝ නම් සෙනෙවියා ලංකාවට ආක්‍රමණය කිරිම

5 ගඩලාදෙණිය විහාරය , ලංකා තිලක විහාරය හා ඇම්බැක්කේ දේවාලය ඉදි කිරිම

# කෝට්ටේ යුගය

- හයවන පරාක්‍රමබාහු  ආරම්භක පාලකයාය
- එතුමාගේ පියා ජයමහලේය මව සුනේත්‍රා දේවියයි
- එතුමා වන්නි , යාපනය හා උඩරට යටත් කොට ලංකාව අවසන් වරට එක්සේසත් කළ පාලකයායි
- යාපනය යටත් කරගත්තේ සපුමල්  කුමරු යැවීමෙනි
- උඩරට ජෝතිය සිටුවරයාගේ කැරැල්ල අම්බුලුගල කුමරු යවා මර්දනය කලේය

**කෝට්ටේ වැදගත් සිදුවීම්**

- හයවන පරාක්‍රමබාහු රජු අවසන් වරට ලංකාව එක්සේසත් කිරීම
- රටේ අධ්‍යාපන ප්‍රබෝධය හා ප්‍රධාන පිරිවෙන් කිහිපයක් ආරම්භ විය

උදා * පැපිලියානේ සුනේත්‍රා දේවි පිරිවෙන (vi වන පරාක්‍රමබාහුගේ මව සිහිවීම පිණිස)

* කෑරගල පද්මාවතී පිරිවෙන

* ඉරුගල් කුලතිලක පිරිවෙන

- ඉබන් බතූතා නම් අරාබි ජාතික සංචරකයා ලංකාවට පැමිණීම

- උගත් පඬිවරු පිරිසක් බිහිවීම

උදා * වීදාගම මෛත්‍රී හිමි

* තොටගමුවේ ශ්‍රී රාහුල හිමි

* වෑත්තෑවේ හිමි

- විශිෂ්ඨ සාහිත්‍ය කෘති රැසක් ලියවීම

උදා * සැළලිහිණි , හංස , ගිරා සංදේශ

* පැරකුම්බා සිරිත

* කාව්‍ය ශේඛරය

* ගුත්තිල කාව්‍ය

# යාපනය රාජධානිය

- '' යාල්පාන වෛපවමාලෛ'' ශේගරාසසේගරමාලෛ'' යන ග්‍රන්ථ යාපනය ගැන සඳහන් මුලාශ්‍ර වේ
- ''ආර්ය චක්‍රවර්ති'' පරපුරේ ආරම්භක පාලකයා විජය කුලංගෛ ආර්ය චක්‍රවර්ති වේ
- ආර්ය චක්‍රවර්ති රජ පරපුරට අයත් රජවරු 12 ක් මුලාශ්‍ර වල දක්වා ඇත
- ගම්පොළ හා කෝට්ටේ යුගවලදි යාපන රාජ්‍ය ප්‍රධාන රාජ්‍යයට යටත් වුවත් පසුව ස්වාධීන වී ඇත
- පෘතුගීසීන් පැමිණෙන විට යාපනය පාලනය කළේ සංකිළි රජුය
- 1619 පෘතුගීසීන් යාපනය අල්ලා ගන්නා ලදි.

**සවියෙන් පෙරට අපි එකට**
***e*- ඉගෙනුම් පාසල**
**හොරණ අධ්‍යාපන කලාපය**

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 7 | ඉතිහාසය | 3 | 4. II කොටස<br>පසුකාලීන පාලන මධ්‍යස්ථානය - ඇගයීම |

**සැකසුම: පතිරගේ මේනක සුරංග**
**පාතකඩ ක.වි**

1. දෙවන පරාක්‍රමබාහු රජුගෙන් සිදු වූ සේවාවන් දෙකක් ලියන්න

2. දෙවන පරාක්‍රමබාහු රජුගේ උපාධි නාමය නම් කරන්න

3. යාපහුව රාජධානිය කරගත් ප්‍රථම පාලකයා කවුද ?

4. කුරුණෑගල යුගයේ රචිත ග්‍රන්ථ තුනක් නම් කරන්න

5. ගම්පොළ යුගයේ චීනයෙන් පැමිණි ආක්‍රමණිකයා කවුද ?

6. අවසන් වරට ලංකාව එක්සේසත් කළ පාලකයා කවුද ?

7. කෝට්ටේ යුගයේ බිහි වූ සංදේශ කාව්‍ය තුනක් නම් කරන්න

8. යාපනය රාජධානිය ගැන සඳහන් ද්‍රවිඩ මූලාශ්‍ර දෙකක් දක්වන්න

9. යාපනය රජ පරම්පරාවේ ආරම්භක පාලකයා කවුද ?

**සවියෙන් පෙරට අපි එකට**
**e- ඉගෙනුම් පාසල**
**හොරණ අධ්‍යාපන කලාපය**

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 7 | ඉතිහාසය | 3 | 4. II කොටස<br>පසුකාලීන පාලන මධ්‍යස්ථානය - පිළිතුරු |

**සැකසුම: පතිරගේ මේනක සුරංග**
**පාතකඩ ක.වි**

1. I දේව ප්‍රතිරාජ ඇමතිවරයා ලවා රටේ සංවර්ධන වැඩ කටයුතු සිදු කිරීම

   ii බෙලිගල තැන්පත් කල දළදාව දඹදෙණියට වැඩම කරවීම

   Iii දඹදෙණියේ දළදා මැදුරක් තැනවීම

   Iv ශ්‍රී පාදස්ථානයට යන මාර්ගය අලුත්වැඩියාවව

2. කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත''

3. පළවෙනි බුවනෙකබාහු රජු

4. පන්සිය පනස් ජාතක පොත

   දළදා සිරිත

   සිංහල බෝධි වංශය

   අනාගත වංශය

5. චෙංහෝ සෙනෙවියා

6. හයවන පරාක්‍රමබාහු රජතුමා

7. සැළලිහිණි , හංස , ගිරා , සංදේශ

8. ''යාල්පාන වෛපමාලෛ''

   ''ශේගරාගසේකරමාලෛ''

9. විජය කුලංගෙ ආර්ය චක්‍රවර්ති රජු